මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2016

**Primary Piriven Year End Term Test - 2016**

**5 වසර /Grade 5**

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

**සිංහල I**

**SINHALA I**

කාලය : පැය 03 යි.

**Time : Three hours**

**I කොටසේ හා II කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද III කොටසින් ප්‍රශ්න දෙකක් ද තෝරාගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.**

## I කොටස

01. කෙටි පිළිතුරු සපයන්න.

i. අ) නූතන සිංහල අක්ෂර මාලාවේ අර්ධානුනාසිකාක්ෂර ලියා දක්වන්න.

ආ) සිංහල අක්ෂර මාලාවේ මූර්ධජාක්ෂර ලියා දක්වන්න.

ii. අ) පහත සඳහන් පද අකාරාදි පිළිවෙළට සකස් කරන්න.

ඉක්බිති, පැසුළු, අනතුරු, පුන, නිසා, උදෙසා, අරභයා

ආ) පහත සඳහන් අක්ෂර උත්පත්ති ස්ථාන අනුව නම් කරන පාරිභාෂික පද ඉදිරියෙන් ලියන්න.

1. ශ............................ 2. ණ............................

3. ස............................ 4. ය............................

iii. පහත දැක්වෙන වචන පේළි දෙකෙහි එක් එක් පේළියෙහි තිබෙන සදොස් අක්ෂර සහිත පද තෝරා ලියා දක්වා ඒවායේ නිදොස් අක්ෂර යෙදූ පද ඉදිරියෙන් ලියන්න.

අ) ගැහැනිය, කොට්ඨාශය, පිළිවෙළ, පිළියෙල.

ආ) ත්‍රෛනිකායික, බාලාංෂය, වාර්ෂික, විරෝදාර.

iv. අ) පහත දැක්වෙන වාක්‍ය කර්තෘකාරකයට හරවන්න.

1. විදුහල්පතිවරයා විසින් ආචාර්යවරු ඇගයෙති.

2. උපාසක විසින් ගම්මු පැසසුණහ.

ආ) පහත දැක්වෙන වාක්‍ය කර්මකාරකයට හරවන්න.

1. රසිකයා නිර්මාණකරුවන් අගයයි.

2. මව සිය දියණිය පෝෂණය කළා ය.

v. පහත දැක්වෙන වචන කාණ්ඩවල සදොස් අක්ෂර වින්‍යාසය සහිත වචන කාණ්ඩයක් ඇත. එම වචන කාණ්ඩය තෝරා ලියා දක්වා ඒවා නිදොස් කොට ඉදිරියෙන් ලියන්න.

අ) බිය සුලු මිනිසා, වපුළ බීජ, මළ ගෙදර, සරන යුග

ආ) කොට්ඨාශ කාර්යාලය, සෞන්දර්ය විද්‍යාලයය, කාර්‍ය මණ්ඩලය

vi. ආ) පහත දැක්වෙන වාක්‍ය කර්ම කාරකයට පෙරළා නැවත ලියන්න.

1. විදුහල්පතිතුමා ශිෂ්‍යයන් යහ මගට යොමු කරයි.
2. කාන්තාවක් අප මෙහෙයවූවාය.
3. ගොවියෝ කෙත් වතු සරු කරති.
4. හෙතෙම නිර්මාණකරුවන් බිහි කරයි.

vii. ආ) පහත දැක්වෙන වාක්‍යවල තිබෙන ඉරි ඇඳි පදවල විභක්ති නාමයන් දක්වන්න.

1. ශිෂ්‍යයා තම විද්‍යාලයට ආදරය කරයි.
2. මම විදුලි බුබුලේ එළියෙන් පාඩම් කරමි.
3. විදුලි බුබුලෙන් දීප්තිමත් එළියක් නිකුත් විය.
4. සාහිත්‍ය ග්‍රන්ථයෝ රසික ලොවට රස ගෙන එති.

viii. ආ) සුදුසු උපසර්ග හිස් තැනට යොදා වාක්‍ය නැවත ලියන්න.

1. ජනතාව .................. ලෝභීව දන් පින් කරති.
2. දරුවෝ .................. ශබ්දව පාඩම් කරති.
3. සියල්ලෝ .................. මත බිඳ දමුහ.
4. ඔවුහු .................. ශීලයෝ නොවෙති.

ආ) සුදුසු විරාම ලකුණු යොදා පහත දැක්වෙන වාක්‍ය නැවත ලියන්න.

1. මම කිසිදා ඉදිරියට යාමට නොපැකිළෙමි යි ඔහු පැවසී ය
2. ඇඳ පුටු මේස සියල්ල රැගෙන නිමල් සිරිනිවසට ගියේ ය

ix. ආ) පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි පද කවර සර්වනාම ගණයට අයත් දැයි ලියන්න.

1. ඔහු නගරයට පිය නගයි.
2. ඔවුහු එතැනට ඉක්මනින් රැස්වූහ.
3. නිමල් ට එය ඉතා පහසුකර විය.
4. අපි සැමදා ගුණගරුක වෙමු.

ආ) සුදුසු නිපාත පද හිස් තැන්වලට යොදා වාක්‍ය නැවත ලියන්න.

1. ඇය මා ..................අමනාප වූවා ය.
2. දෙමාපියන් .................. දරුවන්ට කවර පිහිටක් ද?
3. චෛත්‍යය .................. .................. බෝධිය ද පූජාර්හ වේ.
4. දෙන්නු පැටවුන් .................. අහර සොයා ඇවිදිති.

x. ආ)
1. කරති යන ක්‍රියා පදය උත්තම පුරුෂ බහුවචන අතීතකාල ක්‍රියා පදයක් බවට පෙරළා ලියන්න.
2. දුවන්නෝය යන ක්‍රියා පදය මධ්‍යම පුරුෂ ඒකවචන වර්තමාන කාලයට හරවා ලියන්න.

ආ) පහත දැක්වෙන නාමයන්ට ඉදිරියෙන් ඇති ප්‍රත්‍යය එක් කොට තද්ධිත නාම තනා ඒවා ලියා දක්වන්න.

1. සුන්දර + ය =
2. නිසර්ග + ඉක =
3. නිපුණ + ය =
4. ප්‍රසංග + ඉක =

(ලකුණු 4 × 10 = 40)

11 කොටස

02. පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 200 - 250 පමණ වන සේ රචනයක් ලියන්න.

1. පරිගණක තාක්ෂණය හා තොරතුරු සන්නිවේදනය.
2. රට සුමඟට ගැනීම සඳහා සඟරුවනේ වගකීම.
3. වත්මන් සමාජයේ අපරාධ මැඩලීමට නම්,
4. සූර්ය බලශක්තිය අනාගතයට පිළියමකි. (ලකුණු - 15)

03. පහත දී තිබෙන පද්‍යය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

සන්නත් සිහින් ගෙඳි සෙවනලු වැලි තෙලෙන
තැන්තැන්වල ම සැතපී සියුමැලි බැවින
රන්වන් කරල් ගෙන එන ගිරවුන් අතින
යන් මන් තොසින් මග තොරතුරු නියම දන

1. මෙහි කියවෙන වැලිතලාව කෙබඳු ද ?
2. මග අසන්න යැයි කියන්නේ කාගෙන් ද?
3. මෙම ප්‍රදේශය පිළිබඳව ඇඟවෙන කරුණු මොනවා ද?
4. සැතපී, යන්, යන ක්‍රියාපද කවර වර්ගයේ ක්‍රියා පද ද? (ලකුණු - 15)

111 කොටස

04. පහත දැක්වෙන ගද්‍ය කොටස 1/3 කට පමණ සාරාංශ කරන්න.

මූර්ධජ "ණ" යන්න සහිත පද අද උච්චාරණය කෙරෙන්නේ දන්තජ "න" යන්න උච්චාරණ කෙරෙන විලාසයෙන් ම ය. ණය, තරුණ, පහණ වැනි පද සමකාලීන සිංහලයෙකුගේ මුවින් පිටවන්නේ "නය" "තරුන" "පහන" යනුවෙනි. මෙහි සත්‍යතාව මේ පද යුගය ස්වාභාවිකව උසුරුවා බලන කාට වුව ද ඒත්තු යා යුතු යි. මූර්ධජ "ණ" යනුවෙන් වෙනම ශබ්දයක් අද නැති වුවත් එවැනි ශබ්දයක් පුරාණ සිංහලයෙහි වූ හයි නම් අනුමාන කිරීමට තුඩුදෙන සාධක දෙකක් ඉදිරිපත් කළ හැකි ය. පළමුවැන්න පැරණි ම සිංහල අක්ෂර මාලාව වන බ්‍රාහ්මීය හෝඩියෙහි ද මූර්ධජ "ණ" යනුවෙන් වෙනම අකුරක් පැවතීම යි. දෙවැන්න පුරාතන සිංහලයෙන් බිඳීගිය බසක් වශයෙන් සැලකෙන මාලදිවයින් බසෙහි ඇතැම් උපභාෂාවල අදත් මූර්ධජ "ණ" ශබ්දය හමුවීම යි. මේ ශබ්දය අසන්නට ලැබෙන්නේ මාලදිවයිනේ අගනුවර වන මාලේ නුවර වෙසෙන්නන්ගේ බසෙහි නොව හුවඳු, තිනදූ වැනි ඈත දූපත්වල වෙසෙන්නන් ගේ කතාබස් හී ය.

මාලදිවයින් බස හෙවත් "දිවෙහි බස්" යනු හත්වන සියවසට පෙර අවදියකදී සිංහලයෙන් බිඳීගිය බසක් සේ සැලකේ. මාලදිවයින්වල ආදී වාසීන් සිංහල රටින් එරටට ගොස් පදිංචි වූ පිරිසකැයි යන ජනප්‍රවාදය එරට වැසියන් අතර ද මුල්බැස ගත්තකි. දිවෙහි බසින් ලියා ඇති පැරණිතම ලේඛන වශයෙන් සැලකෙන "ලෝමාෆානු" තඹ සන්නස් හත්වන හෝ අටවන සියවසට අයත් සිංහල අකුරින් ලියා තිබේ.

(ලකුණු - 15)

05. ඔබ පිරිවෙණෙහි අභිනවයෙන් ඉදිකිරීමට යෝජිත කාර්‍යාල ගොඩනැගිල්ල සඳහා මුල්ගල් තැබීම 2016.12.16 දින උත්සවාකාරයෙන් සිදු කිරීමට නියමිත ය. ඒ සඳහා සියලු දෙනා වෙත යැවීමට සුදුසු ආරාධනා පත්‍රයක් සකස් කරන්න.

(ලකුණු - 15)

06. 1. $\sqrt{\text{රකිනු}}$ යන කෘදන්ත රූපය වර්තමාන කාල කර්තෘ කාරකයෙහි සියලු පුරුෂවල ඒකවචන බහුවචන දෙකෙහි වරනගා වගුගත කරන්න.

2. රකින යන කෘදන්ත නාමය ස්ත්‍රී ලිංගයෙහි සියලු විභක්තිවල ඒකවචන බහුවචන දෙකෙහි වරනගා වගුගත කර දක්වන්න. (ලකුණු - 15)

The National e-learning Portal for The General Education

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2016

**Primary Piriven Year End Term Test - 2016**

**5 වසර /Grade 5**

**සිංහල II**

**SINHALA II**

කාලය : පැය 03 යි.

**Time : Three hours**

**I** කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද, **II** කොටසින් ප්‍රශ්න හතරක් ද තෝරාගෙන ප්‍රශ්න 05කට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

01. දී ඇති ගද්‍ය පද්‍ය පාඨ ලිහිල් බසින් ලියා ඉරි ඇඳි පදවල අර්ථ වෙන ම ලියා දක්වන්න.

i. බෝමැඩට දකුණු දිශා භාගයෙහි වූ කිරිපලු රුක් මුල්හි වැඩහිඳ <u>ඵලසමාපත්ති</u> සැපය අනුභව කෙරෙමින් .........

ii. සුපිපි <u>රත්පියුම් හෙළපියුම් ඇඹුල උපුලින්</u> සැරහුණා වූ පිරුණු පොකුණු ඇති,

iii. අනංග නැමැති විලට කල හංසයකු බඳු වූ <u>මැණික්මය වූ නුරුවළා පාපියුම්</u> පහසින් නොගන්නී යැ .......

iv. මෙසේ අනන්තරොක්ත ක්‍රමයෙන් <u>දහසක් නයින් ප්‍රතිමණ්ඩිත වූ</u> සත් භවයක් ඉක්මැ නො පවත්නා වූ සෝවාන් පලයට පැමිණැ .........

v. එකල්හි දසදහසක් සක්වළැ සියලු <u>කාමාවචරාදී දිව්‍ය සමූහයෝ</u> සන්තුෂ්ට වූ සිත් ඇති වැ .......

vi. කොමලඟනන් <u>වුවනත් උඩුකුරු කොට</u>
තම මුහුලත් බැඳ පිහිනනු දිය පිට

vii. <u>වනගැබ ඔබිනොබ</u> පැන යන නොල සා
තැන තැන මුවරළ දැක යව සතො සා

viii. කියමින් <u>වෙන වෙන වාසී පැ බල</u>
ඉදිමින් දියතුළ නොපෙනී බෝ කල

ix. නොමඳ <u>බමර'කුරු රැඳි මල් රෙහෙණු පට</u>
පැහැද නිතොර ඇරගෙන සිය අතු අතට

x. පහත දැක්වෙන උද්ධෘතවල අවස්ථා සම්බන්ධය ලියන්න.

ඇ) සමහර සුපිළිපන් සඟ ගණ මන මෙනය
පුවතර අරුත් ටීකා ගෙන වෙන වෙන ය

ආ) පුතණුවෙනි, ගමන්ගත් රුවන් මෙරගිරි සිරින් කිඹුල්වත් පුර නැමැති සාගර මධ්‍යයෙහි බබළමින් අනේක ප්‍රකාර වූ .............

(ලකුණු 4 x 10 = 40)

## II කොටස

02. "වංශකතා අතර සිංහල බෝධිවංශය සාහිත්‍යමය වශයෙන් ද වැදගත් කෘතියක් ලෙස අගය කළ හැකි ය." විමසන්න.

(ලකුණු 15)

03. කෝට්ටේ යුගයේ රචිත සන්දේශ අතරින් "ගිරා සංදේශය" සුවිශේෂී වන්නේ කුමන හේතු නිසාදැයි විභාග කරන්න.

(ලකුණු 15)

04. ඔබ කැමති වැනුම් දෙකක් ඇසුරින් "ගිරා සංදේශ" කතුවරයාගේ ප්‍රතිභා ශක්තිය අගය කරන්න.

(ලකුණු 15)

05. "ඩිංගිරි මැණිකා" නවකතාව රචනා කළ පියදාස සිරිසේන සූරීන් එමගින් ඉටුකර ගැනීමට උත්සහ කළ අරමුණු විග්‍රහ කරන්න.

(ලකුණු 15)

06. "පද්‍යාවලී I" පද්‍ය සංග්‍රහයේ ඔබ කැමති පද්‍ය පන්ති දෙකක් ඇසුරින් සමකාලීන සමාජ විවරණයක් සිදු වූ ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 15)

07. "ඩිංගිරි මැණිකා" නවකතාවේ සිත්ගත් චරිතයක් හඳුන්වා කතුවරයා විසින් ප්‍රධාන කතා පුවතට එම චරිතය යොදා ගත් ආකාරය විමසීමකට බඳුන් කරන්න.

(ලකුණු 15)